(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 3(4).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2026 ජනවාරි 23 සිකුරාදා**

**2026 පෙබරවාරි 03 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ රෙගුලාසි,— 1996 අංක 27 සහ 2024 අංක 39 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් මඟින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17(10) වගන්තිය සමඟ කියවිය යුතු 71(1) වගන්තිය යටතේ විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල් භාවිතාව සම්බන්ධයෙන් එවකට තාක්ෂණ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 අගෝස්තු 07 දිනැති අංක 2396/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.01.23 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2026 පෙබරවාරි 17 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1184/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, තමිල්වෝලෛ විද්‍යාලය නමින් පාසැලක් පැවැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පාසැල ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම පාසැලේ සිසුන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට සහ 05 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට අවසන් වරට පෙනී සිට ඇති වර්ෂ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මේ වනවිට ඉහත පාසැලේ නාමය කවරේද;

(v) එම පාසැලේ නාමය සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබූයේ කවුරුන් විසින්ද;

(vi) ඊට හේතු කවරේද;

(vii) එම සංශෝධනය කරනු ලැබූ දිනය කවරේද;

(viii) එම පාසැලේ නාමය සඳහා එම පාසැලේ නිර්මාතෘවරයාගේ හෝ පාසැල ආරම්භ කිරීමට පුරෝගාමී වූ පුද්ගලයෙකුගේ නමක් යොදා ගත හැකිද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1223/2025

ගරු සුරංග රත්නායක මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූර්ය බල පැනල මඟින් උත්පාදනය කර ශ්‍රී ලංකාවේ ජාතික විදුලිබල පද්ධතියට දිනකට එක් කරනු ලබන විදුලි ඒකක සංඛ්‍යාව මෙගාවොට් කොපමණද;

(ii) මෙගාවොට් එකක් සඳහා ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) එම මුදල මේ වනවිට අඩු කර තිබේද;

(iv) එසේ නම්, නව මුදල කොපමණද;

(v) සූර්ය බල පැනල මඟින් විදුලිය උත්පාදනය කිරීම දිරිගැන්වීම සඳහා වන ඉදිරි වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1363/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) යම් පාසැලක අවුරුදු අටකට වැඩි කාලයක් සේවය කරමින් සිටින විදුහල්පතිවරුන්ගේ සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විදුහල්පතිවරයෙක් එකම පාසැලක අවුරුදු අටකට වැඩි කාලයක් අඛණ්ඩව සේවයේ යෙදීම හේතුවෙන් උද්ගතවී ඇති ගැටලු කවරේද;

(iii) 2012 වර්ෂයේදී අධි සේවක පදනම මත, විදුහල්පතිවරුන් ලෙස අන්තර්ග්‍රහණය කරනු ලැබ ඇති තැනැත්තන් හට උසස්වීම් ලබාදී ඇතත්, ඔවුන්ගේ සේවයට අදාළ පරිපාලන දීමනා ලබාදී නොමැති බව දන්නේද;

(iv) ඒ සඳහා ඇති බාධා කවරේද;

(v) පාසැල්වල පවතින විදුහල්පති පුරප්පාඩු සඳහා, අධි සේවක පදනමේ සිටින විදුහල්පතිවරුන්ට අයදුම් කිරීමට පවතින බාධා කවරේද;

(vi) අවුරුදු අටකට වැඩි කාලයක් එකම පාසැලක අධි සේවක පදනම මත සේවය කරන විදුහල්පතිවරුන්ට, ස්ථාන මාරු ලබා දීමේ හැකියාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1409/2025

ගරු (වෛද්‍ය) පද්මනාදන් සත්‍යලිංගම් මහතා,— මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයේ රැකියා අවස්ථා ලබා දීම සඳහා ආරම්භ කර ඇති රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශයේ ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට රජය විසින් ලබා දෙනු ලබන සහන කවරේද;

(iii) ආයෝජකයින්ට දුෂ්කරතාවයකින් තොරව රජයේ ඉඩම් ලබාගැනීම සඳහා සරල ක්‍රමවේදයක් හඳුන්වාදී තිබේද;

(iv) සියලු සේවා එකම ස්ථානයකින් සැපයීමට හැකි වන පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ආයෝජන මණ්ඩලය මඟින් විශේෂ ඒකක ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, ඒවා ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද:

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1452/2025

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මුලතිව්, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්ක තුළ —

(i) ප්‍රජා ශාලා පිහිටුවා ඇති ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) අඩුපාඩු රහිත, භාවිතයට සුදුසු තත්ත්වයේ පවතින ප්‍රජා ශාලා සංඛ්‍යාව;

(iii) වැසිකිළි, ජල හෝ විදුලිය පහසුකම් නොමැති ප්‍රජා ශාලා සංඛ්‍යාව;

(iv) ප්‍රජා ශාලා නොමැති ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද;

(ආ) (i) ඉහත අඩුපාඩු හේතුවෙන් මහජනතාවට සේවා ලබා ගැනීමේදී දුෂ්කරතාවලට මුහුණ දෙන බව දන්නේද;

(ii) ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා ඉහත අඩුපාඩු සපුරාලීමේ සැලසුම කවරේද;

(iii) ප්‍රජා ශාලා නොමැති ග්‍රාම නිලධාරි කොට්ඨාසවල නව ප්‍රජා ශාලා ඉදිකිරීමට සැලසුමක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1475/2025

ගරු රොෂාන් අක්මීමන මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ගැසට් කර හෝ හඳුනාගෙන ඇති රක්ෂිත වනාන්තර ප්‍රමාණය සහ රක්ෂිත වනාන්තර බවට පත් කිරීමට යෝජිත වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර්වලින් කොපමණද;

(ii) දීර්ඝ කාලයක් තිස්සේ පදිංචිවී ඇති හෝ වගා කටයුතු සඳහා භාවිතා කර ඇති නමුත්, පසුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට ගෙන ඇති ඉඩම් ප්‍රමාණය එම දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම්වලින් නැවත නිදහස් කිරීම සඳහා නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම පාලනය කිරීම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1559/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජාතික මට්ටමේ ක්‍රීඩා තරඟ පැවැත්වීම සඳහා සුදුසු ක්‍රීඩාංගනයක් නොමැති බවත්;

(ii) 'මැකේසර් ක්‍රීඩාංගනය' (MC Heyzer Stadium) සංවර්ධනය කිරීම ආරම්භ කළ නමුත්, මේ වනවිට එම කටයුතු අත්හැර දමා ඇති බවත්;

(iii) ලෙදර් පන්දු ක්‍රිකට් ක්‍රීඩකයන් බහුලව සිටියද ඒ සඳහා සුදුසු තණතීරු සහිත ක්‍රීඩාංගනයක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 'මැකේසර් ක්‍රීඩාංගනයේ' සංවර්ධන කටයුතු අත්හැර දැමීමට හේතු කවරේද;

(ii) එම ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේදී නෛතික හෝ වෙනත් ගැටලු මතුවන්නේ නම්, වෙනත් ස්ථානයක සියලු පහසුකම් සහිත ක්‍රීඩාංගනයක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(iii) කන්තලේ, ත්‍රිකුණාමලය, කින්නියා සහ මුතූර් යන ප්‍රදේශවලද ලෙදර් පන්දු ක්‍රිකට් ක්‍රීඩාංගන ඉදිකිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නැගෙනහිර පළාතේ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිකට් ක්‍රීඩාංගනයක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එය ඉදිකරනු ලබන කාලවකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1697/2025

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ආබාධ සහිත තැනැත්තන්ගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) ඔවුන්ට සායනික සහ අනෙකුත් සේවාවන් ලබාගැනීමට අදාළ පහසුකම් සැපයීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) වෛද්‍ය ආයතනවලට ප්‍රවේශවීමේදී ආබාධිත පුද්ගලයන් හඳුනාගැනීමේ සහ ප්‍රමුඛතාවය ලබාදීම සඳහා පවතින වැඩපිළිවෙළ කවරේද;

(iv) ආබාධිත පුද්ගලයන්ට සෞඛ්‍ය සේවා සපයන නිලධාරීන්ගේ වෘත්තිමය සහ ආකල්පමය නිපුණතා වර්ධනය සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආබාධිත පුද්ගලයන්ගේ —

(i) සෞඛ්‍ය ගැටලු විසඳීම සඳහා ගනු ලබන තාක්ෂණික උපායමාර්ග කවරේද;

(ii) සෞඛ්‍ය සහාය පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා නව තාක්ෂණය භාවිතා කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) ඖෂධ සහ පරීක්ෂණ සඳහා මූල්‍ය ආධාර ලබාදීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) සෞඛ්‍ය සේවයට ඇති සම ප්‍රවේශ පහසුකම් ලබාදීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1702/2025

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයට අයත් ජනමාධ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ආයතනවල මේ වනවිට ලියාපදිංචිවී සිටින මාධ්‍යවේදීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන් සඳහා ගෙවනු ලබන වැටුප් හා දීමනා කවරේද;

(v) ඒවා ගෙවනු ලබන ක්‍රමවේදය කවරේද;

(vi) මෙම ක්‍රමවේදය යටතේ ගෙවීම් සිදු කරනු ලැබීමේදී අක්‍රමිකතා සිදුවී ඇති බව දන්නේද;

(vii) එසේ නම්, එම අක්‍රමිකතා සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1785/2025

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් විදේශීය සමුද්‍රීය ආරක්ෂක සමාගම් වෙත ආරක්ෂාව සැපයීම ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා වගකීම පැවරී තිබූ ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ආරක්ෂාව සැපයීමේ වගකීම වෙනස්වී තිබේ නම් —

(i) වෙනසකට ලක්වූ වර්ෂය කවරේද;

(ii) නව සමාගමේ නම සහ ස්වභාවය කවරේද;

(iii) 2025 වර්ෂය දක්වා එම සමාගම ලැබූ ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සමාගම හවුල් සමාගමක් නම්, එක් එක් පාර්ශ්වය වෙත හිමි ලාභ ප්‍රතිශතය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම සමාගම —

(i) ආරම්භයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලැබී ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(ii) සැපයූ සේවා සඳහා ගාස්තු තීරණය කරනු ලැබූ ආකාරය කවරේද;

(iii) සඳහා ත්‍රිවිධ හමුදාව විසින් ලබාදී ඇති ගිනි අවි සංඛ්‍යාව වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) විසින් ගිනි අවි වෙනුවෙන් ගෙවා ඇති මුදල කොපමණද;

යන්නත් තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 පෙබරවාරි 18 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1466/2025

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැවිලි වතුවල සේවකයින් වන සතුන්ගේ ප්‍රහාරයන්ට ගොදුරුවීම්, සර්පයින් හා බඹරුන්ගේ දෂ්ට කිරීම් සහ රසායනික ද්‍රව්‍ය නිසා සිදු වන අනතුරුවලට ලක් වන බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් පැමිණිලි ලැබෙන්නේද;

(iii) එසේ නම්, පසුගිය වසර පහ තුළ ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත අනතුරුවලින් සේවකයින් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැවිලි වතු සේවකයින් සේවා ස්ථානවලදී සේවායෝජකයින්ගෙන් වාචික, ශාරීරික හෝ වෙනත් ආකාරයෙන් හිංසනයට ලක් වන බව දන්නේද;

(ii) එම හිංසන වළක්වා ගැනීම සඳහා නීතිමය පියවර ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1500/2025

ගරු බී. ආරියවංශ මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වතු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා එම වතු නිවාස සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වතු නිවාස සංවර්ධනය කිරීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1542/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යටියන්තොට, නාගස්තැන්න වතු යාය මේ වනවිට අයත් වන්නේ කවුරුන්ටද;

(ii) එම වතු යායේ කළමනාකරණය ප්‍රශස්ථ මට්ටමක තිබේද;

(iii) එම වතු යායේ ඉඩම් පෞද්ගලික පාර්ශ්වයන් විසින් අත්පත් කර ගන්නා බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ආර්ථික, පාරිසරික හා සමාජීය වශයෙන් වටිනා ඉහත වතු යායේ ඉඩම් සංවර්ධනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1576/2025

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 වර්ෂයේදී ඉන්දියානු රජය විසින් මලයගම් ජනතාව වෙනුවෙන් 'සිටි රයිඩර්' බස් රථ ලබා දුන් බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iii) එම බස් රථ ලබාදීමේ අරමුණ කවරේද;

(iv) එම බස් රථ ලබා දුන් සංවිධාන සහ ඒවා ලබාගත් අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

(v) එම බස් රථවලින් බදුල්ල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක සඳහා ලබා දුන් බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම බස් රථවල වර්තමාන තත්ත්වය කවරේද;

(vii) එම බස් රථ මේ වනවිට භාවිතා කරනු ලබන පාර්ශ්ව සහ භාවිතා කරනු ලබන කාර්යයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1637/2025

ගරු රුවන් විජේවීර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'සැමට සෙවන' ව්‍යාපෘතිය යටතේ, මොනරාගල දිස්ත්‍රික්ක තුළ ඉදිකිරීමට සැලසුම් කරන ලද නිවාස සංඛ්‍යාව සහ සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කරන ලද නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගන්නා ලද මූලාශ්‍රය කවරේද;

(iii) මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා, ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී යොදා ගන්නා ලද නිර්ණායක කවරේද;

(iv) මෙම ව්‍යාපෘතිය යටතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(v) ඒ සඳහා වෙන් කරන ලද මුදල සහ සත්‍ය වශයෙන් වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1664/2025

ගරු සංජීව රණසිංහ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කළුතර දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම්වලින්, බදු පදනම මත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය, මහජනතාව වෙත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය, නිදහස් ඔප්පු ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය සහ බලපත්‍ර මඟින් මහජනතාව වෙත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බලපත්‍රලාභී ඉඩම් සඳහා නිදහස් ඔප්පු ලබාදීමේ හැකියාවක් තිබෙන්නේද;

(iv) මහජනතාව වෙනුවෙන් ලබාදී ඇති ඉඩම්වලින්, ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා ඇති ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ඉඩම් නැවත පවරාගෙන, ඉඩම් නොමැති අය සඳහා ලබාදීමේ හැකියාවක් තිබෙන්නේද;

(vi) පුද්ගලයන් හෝ ආයතන විසින්, අයථා ලෙස අත්පත් කරගෙන ඇති, කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1696/2025

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වාණිජ කටයුතු සඳහා පුපුරණ ද්‍රව්‍ය යොදා ගැනීම සම්බන්ධව දැනට පවතින නීති සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන අංශ කවරේද;

(ii) පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීමේ සහ නිකුත් කිරීමේ ක්‍රමවේදය කවරේද;

(iii) ඒවා ක්‍රියාත්මක කරන නිලධාරින්ගේ තනතුරු කවරේද;

(iv) ඒ සඳහා දිස්ත්‍රික්ක භාර සහකාර නිලධාරින් පත් කර තිබේ නම්, ඔවුන්ගේ කාර්යභාරය කවරේද;

(v) මේ වනවිට වෙඩි බෙහෙත් පාලක තනතුර පුරප්පාඩුවී තිබේද;

(vi) එම පුරප්පාඩුව පිරවීමට කටයුතු කරන්නේද;

(vii) ඉහත තනතුරට දෙවන පෙළ නිලධාරින් සූදානම් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වාණිජමය පදනම මත නිකුත් කර ඇති පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර සහ මේ වනවිට ක්‍රියාකාරි බලපත්‍රලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම බලපත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කරන ක්‍රමවේදය කවරේද;

(iii) එම බලපත්‍ර නියාමනය කරන්නේද;

(iv) පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා යොදා ගන්නා පෞද්ගලික මධ්‍යස්ථාන කවරේද;

(v) ඒවායේ ආරක්ෂාව සඳහා ගෙන ඇති පියවර කවරේද;

(vi) බලපත්‍රලාභියෙකුට වරකට නිකුත් කරන පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1720/2025

ගරු ඔෂානි උමංගා මහත්මිය,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කම්කරු දෙපාර්තමේන්තුවේ, පැමිණිලි අංශය විසින් පැමිණිල්ලක් විසඳීම සඳහා ගත වන සාමාන්‍ය කාලය කොපමණද;

(ii) මේ වනවිට, එම අංශයේ පවතින නොවිසඳුනු පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) එම පැමිණිලි කඩිනමින් හා ඵලදායිව විසඳීම සඳහා පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1739/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (1)

(අ) (i) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුනාමියෙන් පසුව ප්‍රතිසංස්කරණය කළ ධීවර ගොඩනැගිලි ඇති බවත්;

(ii) එම ගොඩනැගිලි අතරින් කුලී සහ බදු පදනම මත ලබා දෙන ලද සහ විකුණන ලද ධීවර ගොඩනැගිලි ඇති බවත්;

(iii) එම ගොඩනැගිලි අතරින් මේ දක්වා භාවිතා නොකරන ලද ගොඩනැගිලි ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(iii)හි සඳහන් ධීවර ගොඩනැගිලි රජයේ සහ පොදු අවශ්‍යතාවයන් සඳහා ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) සුළු පන්න ධීවර සම්මේලනය මඟින් සුනාමියෙන් පසුව ජලාල්ඩීන් චතුරශ්‍රය සහ කනකර් ග්‍රාම නිලධාරි වසම්වල ඉදිකළ ධීවර බහු කාර්ය ගොඩනැගිලි භාරව කටයුතු කරන, ආදායම් අය කරන සහ නඩත්තු කටයුතු කරන පාර්ශ්වයන් කවරේද;

(iii) ඉහත ගොඩනැගිලි පරිශ්‍රයන්හි අයිතිකරුවන් හඳුනාගතහොත්, ඔවුන්ට පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් විකල්ප ඉඩම් ලබා දීමෙන්, මෙම ධීවර බහුකාර්ය ගොඩනැගිලි පොතුවිල් ප්‍රාදේශීය සභාවට හෝ මහජන භාවිතයට ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1809/2026

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අසාධාරණයට ලක්වූ තැන්පත්කරුවන්ගෙන් ගම්පහ සණස බැංකුව සම්බන්ධයෙන් පොලීසිය වෙත පැමිණිලි ලැබී තිබේද;

(ii) එසේ නම්, එම පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) එම පැමිණිලි පොලීසිය වෙත ලැබුණු දිනය එක් එක් පැමිණිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පැමිණිලි සම්බන්ධයෙන් පොලීසිය විසින් මේ දක්වා සිදු කර ඇති විමර්ශනවල ප්‍රගතිය කවරේද;

(v) සණස බැංකුව මඟින් ණය ලබාගෙන ඇති Gampaha Development Company (PVT) Ltd, (GDC) ආයතනය සම්බන්ධයෙන් පොලීසිය වෙත පැමිණිලි ලැබී තිබේද;

(vi) එසේ නම්, එම පැමිණිලි සම්බන්ධයෙන් මේ දක්වා සිදු කර ඇති විමර්ශනවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 පෙබරවාරි 19 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

22/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමහර පාරිභෝගික භාණ්ඩ සඳහා වරින් වර රජය විසින් උපරිම මිලක් නියම කරනු ලබන බවත්;

(ii) එම භාණ්ඩ සමහර වෙළෙන්දන් විසින් වැඩි මිලට අළෙවි කරන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම භාණ්ඩ වැඩි මිලට අළෙවි කරන වෙළඳසැල් වටලන ආයතනය කවරේද;

(ii) එම ආයතනය විසින් මාසිකව සිදු කරනු ලබන වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(iii) භාණ්ඩ වැඩි මිලට අළෙවි කරන පුද්ගලයන්ට ලබා දිය හැකි දඬුවම් කවරේද;

(iv) දිගින් දිගටම වැඩි මිලට භාණ්ඩ අළෙවි කරන වෙළඳසැල් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

117/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වනවිට පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මේ වනවිට ගෙවනු ලබන වැටුප් හා දීමනා කවරේද;

(iii) වැටුප් හා දීමනා නොගන්නා මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

353/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, පෝරතිවුපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාක්කාච්චිවට්ටෙයි, විලාන්තෝට්ටම්, දික්කෝඩෛ-දුම්බාලෙයි සහ මන්මුනෛපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරාන්කුලම්-ධර්මපුරම් යන ප්‍රදේශවලට පානීය ජල පහසුකම් ලබා දිය යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඉහත සඳහන් ප්‍රදේශවලට පානීය ජල පහසුකම් ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

564/2025

ගරු රෝහණ බංඩාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් නිෂ්පාදනය කරන ලද ඖෂධ වර්ග සංඛ්‍යාව සහ එම ඖෂධවල නාමයන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ඖෂධ අතරින් නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිලට පෞද්ගලික වෙළඳුන්ට අලෙවි කරන ලද ඖෂධ වර්ග සහ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ හේතුවෙන් ඉහත සංස්ථාවට සිදුවී ඇති අලාභය කොපමණද;

(iv) මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

628/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කදුරුවෙල නගරයේ අත්හැර දමන ලද වෙළෙඳ සංකීර්ණයක් තිබෙන බව දන්නේද;

(ii) එම වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම වෙළෙඳ සංකීර්ණය නැවත භාවිතයට ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1264/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබන ලියාපදිංචි ව්‍යාපාරිකයන් සංඛ්‍යාව එක් එක් ආර්ථික මධ්‍යස්ථානය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් ආර්ථික මධ්‍යස්ථාන සීමිත සමාගම් ලෙස සංස්ථාගත කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම ආර්ථික මධ්‍යස්ථානවල වර්තමානයේ ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින්නන්ට තම ව්‍යාපාර බාධාවකින් තොරව සිදු කරගෙන යෑමටත්, කිසිදු අගතියක් සිදු නොවන බවටත් තහවුරු කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1717/2025

ගරු ආර්.ජී. විජේරත්න මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010, 2011, 2012, 2013 සහ 2014 යන වර්ෂයන්හි ජාතික ආර්ථික දත්ත විකෘති කරමින් (Data Massage) ආර්ථික සංවර්ධන වේගය හා උද්ධමන අනුපාත අගයන් වෙනස් කර ඇති බව පිළිගන්නේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

(iii) වර්ෂ 2004 සිට 2014 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ආර්ථිකයේ මූලික දත්ත වෙනස් කරමින්, ජාතික ආදායමේ වාර්ෂික වර්ධන වේගය වැඩිකර පෙන්වා දෙමින්, අඩු ආදායම් ආර්ථිකයක් කෘත්‍රිමව මවා පාමින් අධික පොලියට දේශීය හා විදේශීය ණය ගැනීමට උපක්‍රමශීලීව කටයුතු කර තිබේද;

(iv) වර්ෂ 2004 සිට 2015 දක්වා කාලය තුළ මෙම දූෂණ, වංචා සහ අක්‍රමිකතාවයන් සිදු කළ ආර්ථික ඝාතකයන් සහ 2022 වර්ෂයේදී රට බංකොලොත් වීම අතර සම්බන්ධයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1719/2025

ගරු තනුර දිසානායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සිවිල් පුද්ගලයෙකුට බලපත්‍ර මත ගිනි අවියක් නිකුත් කිරීමේදී අනුගමනය කරන ක්‍රමවේදය කවරේද;

(ii) එලෙස බලපත්‍ර මත ගිනි අවි ලබාදීම මේ වනවිට නවත්වා තිබේද;

(iii) එසේ නම්, එයට හේතු කවරේද;

(iv) ඉහත බලපත්‍ර නිකුත් කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය, ක්‍රමවේදය සහ නිර්ණායක කවරේද;

(v) බලපත්‍ර මත ගිනි අවි නිකුත් කිරීමට ආරක්ෂක නිෂ්කාශන ලබා ගන්නා ක්‍රමවේදය කවරේද;

(vi) එහිදී ඇතිවන ප්‍රමාදයන් මගහරවා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගිනි අවි ආඥාපනත කාලීනව සංශෝධනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) අවසන් වරට ගිනි අවි බලපත්‍ර ගාස්තු සංශෝධනය කර ඇති දිනය කවරේද;

(iii) ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගෙන තිබේ නම්, එම දිනය කවරේද;

(iv) බලපත්‍ර ගාස්තු ගෙවීම පැහැර හැරීමේදී ගෙවනු ලබන දඩ මුදල්වල සංශෝධනයක් කර තිබේද;

(v) බලපත්‍ර විනාශවීමක්, පැවරීමක් හෝ ගිනි අවි අලුත්වැඩියා කිරීමට අදාළ ගාස්තු සංශෝධනය කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1808/2026

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුතු ස්ථාන පිහිටා ඇති බව දන්නේද;

(ii) බද්දේගම, නාගොඩ, වැලිවිටිය දිවිතුර, නියාගම, තවලම සහ නෙලුව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශවල පිහිටා ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන කවරේද;

(iii) එම ස්ථාන අතරින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ස්ථාන කවරේද;

(iv) ඉහත (ii)හි සඳහන් ප්‍රදේශ අතරින් අතීතයේ උඩරට රාජධානියට අයත්ව තිබූ ප්‍රදේශ කවරේද;

(v) එම ස්ථාන සංරක්ෂණය සඳහා ගනු ලබන පියවර කවරේද;

(vi) එම පුරාවිද්‍යා ස්ථාන පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1834/2026

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ රෝහල්වල සේවය කරනු ලබන උපස්ථායක/උපස්ථායිකාවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) සේවා අවශ්‍යතාවයට සාපේක්ෂව එම රෝහල්වල උපස්ථායකවරුන්ගේ අඩුවක් තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iv) උසස් තත්ත්වයේ රෝගී සත්කාර සේවාවක් ලබාදීම සඳහා, එක් උපස්ථායකවරයෙකුට වෙන් කළ යුතු රෝගීන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ රෝහල්වල අවශ්‍ය ප්‍රමාණයට උපස්ථායකවරුන් නොමැති වීම හේතුවෙන්, රෝගීන්ගේ භාරකරුවන්හට මුදල් ගෙවා බාහිර උපස්ථායකවරුන් ලබා ගැනීමට සිදුව ඇති බවත්;

(ii) දින කිහිපයක් සඳහා උපස්ථායකවරයෙකුගේ සේවය ලබා ගැනීමට අධික වියදමක් දැරීමට සිදු වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) රජයේ රෝහල්වල නේවාසික ප්‍රතිකාර ලබන රෝගීන් සඳහා අවශ්‍ය උපස්ථායකවරුන් බඳවා ගැනීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 පෙබරවාරි 20 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

206/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළ කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය පහළ ගොස් තිබේ නම්, ඊට හේතු කවරේද;

(iii) කෘෂිකාර්මික ක්ෂේත්‍රය වෙත තරුණයන් ආකර්ෂණය කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

228/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කොළඹ, දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය පිහිටුවන ලද නීතිය කවරේද;

(ii) එම අධිකරණයේ කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම අධිකරණයේ මේ වනවිට විභාග කරනු ලබන නඩු සංඛ්‍යාව සහ එම අධිකරණය මඟින් විභාග කර අවසන් කරන ලද නඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ආරම්භ කරන ලද දිනයේ සිට මේ දක්වා එම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු කටයුතු ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම අකර්මන්‍යවී ඇති බව පිළිගන්නේද;

(ii) අල්ලස්, මූල්‍ය අපරාධ සහ මූල්‍ය දූෂණ සම්බන්ධයෙන්වූ නඩු කඩිනමින් විභාග කර අවසන් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

472/2025

ගරු රවී කරුණානායක මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහපොළ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් කවරේද;

(ii) එම අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීමේ බලධාරියා කවුරුන්ද;

(iii) මේ වන විට එම අරමුදලේ මුළු වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මහපොළ භාරකාර අරමුදල ආරම්භයේ සිට මේ දක්වා —

(i) එම අරමුදලට වාර්ෂිකව ලැබුණු අරමුදල් ප්‍රමාණය සහ එම අරමුදල්වල මූලාශ්‍ර කවරේද;

(ii) එම අරමුදලේ වාර්ෂික පුනරාවර්තන වියදම කොපමණද;

(iii) ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා සහ පුනරාවර්තන නොවන වියදම් සඳහා එම කාර්යය ඉටුකිරීම වෙනුවෙන් අරමුදල විසින් වාර්ෂිකව සිදු කරන ලද ගෙවීම් ප්‍රමාණය කොපමණද;

(iv) උපාධි අපේක්ෂකයින්ට වාර්ෂිකව ප්‍රදානය කරන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව කොපමණද;

(v) ශිෂ්‍යත්ව ලබා ඇති මුළු සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

826/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 ජනවාරි 01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනය ලබා ඇති සම්පූර්ණ අලාභය කොපමණද;

(ii) ඒ අතරින් මෙහෙයුම් අලාභය කොපමණද;

(iii) එම ආයතනය විසින් ගුවන්යානා සඳහා ගෙවනු ලබන වාර්ෂික ලීසිං වාරිකය/ණය වාරිකය කොපමණද;

(iv) එම ලීසිං වාරිකය/ණය වාරිකය ගෙවනු ලබන ගුවන්යානා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනය විසින් ලබා ගෙන ඇති මුළු ණය ප්‍රමාණය කොපමණද;

(ii) එම ණය වෙනුවෙන් වාර්ෂිකව ගෙවිය යුතු මුළු ණය වාරිකය කොපමණද;

(iii) එම ණය වාරිකයේ ඇති ප්‍රාග්ධන මුදල හා පොළී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

883/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී කෝරළේ පත්තුව, වාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු (Deeds of Grant) හෝ ඉඩම් බලපත්‍ර (Land permits) ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෝරළේ පත්තුව, වාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1124/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත කොළඹ නැව් තටාකාංගනය සමාගමේ (Colombo Dockyard PLC) අයිතිය සම්පූර්ණයෙන්ම රජය සතුව පවතින්නේද;

(ii) එම සමාගමේ තවත් කොටස්කරුවන් සිටී නම්, ඔවුන්ගේ නම් කවරේද;

(iii) රජය සහ අනෙකුත් කොටස්කරුවන් අතර පවතින කොටස් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අනෙකුත් කොටස්කරුවන් සතු වත්කම්වල අගය ඩොලර්වලින් කොපමණද;

(v) වර්තමාන කොටස්කරුවන් වෙත කොටස් හිමිකම් ලබා දුන් වර්ෂ කවරේද;

(vi) ඔවුන්ට කොටස් විකිණීමේදී ටෙන්ඩර් කැඳවා තිබේද;

(vii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද එක් එක් කොටස්කරුගේ නම, ලිපිනය සහ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(viii) එම එක් එක් කොටස්කරු මිලදී ගන්නා ලද කොටස්වලට අනුව ආයෝජනය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1244/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති වනජීවී කලාප එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් වනජීවී කලාපයට අයත් භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වනජීවී කලාප තුළ වනජීවීන් වෙනුවෙන් ඇති වැව්, අමුණු සහ විල් හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, එම සංඛ්‍යාව එක් එක් වනජීවී කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත වනජීවී කලාප තුළ මේ වනවිට ප්‍රතිසංස්කරණය කර හෝ ඉදිකර ඇති වැව්, අමුණු සහ විල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් විද්‍යාත්මකව හඳුනාගෙන ඇති වනඅලි කොරිඩෝ කවරේද;

(ii) ඒවා ගැසට් කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට ගැසට් කර ඇති වනඅලි කොරිඩෝ කවරේද;

(iv) හඳුනාගෙන ඇති වනඅලි කොරිඩෝ මේ වනතෙක් ගැසට් කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1649/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 සැප්තැම්බර් 21 දින සිට මේ දක්වා කරන ලද වැටලීම්වලදී අත්අඩංගුවට ගනු ලැබූ නීති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රමාණය සහ සැකකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලසීමාව තුළ මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ ක්‍රියා මගින් උපයා ගන්නා ලදුව ක්‍රියාවිරහිත කරන ලද දේපළ හා වත්කම්වල ප්‍රමාණය සහ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම දේපළ හා වත්කම්වල අයිතිකරුවන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1653/2025

ගරු අජිත් ගිහාන් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක ආකර්ෂණය රටේ ප්‍රදේශ කිහිපයකට පමණක් සීමාවී ඇති බවත්;

(ii) සංචාරක කර්මාන්තය සඳහා වැඩි විභවයක් ඇති පුත්තලම දිස්ත්‍රික්කය සංචාරක ගමනාන්තයක් ලෙස දියුණු කිරීම සඳහා මේ දක්වා වැඩපිළිවෙළක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා හඳුනාගෙන ඇති සංචාරක ගමනාන්ත කවරේද;

(ii) ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1710/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 නොවැම්බර් මාසයෙන් පසු මේ දක්වා ලැබී ඇති ආයෝජන, එම ආයෝජන ප්‍රමාණය සහ ලබා දුන් රටවල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම රටවල්වලින් ආයෝජනය කරනු ලැබූ සම්පූර්ණ මුදල ඇමෙරිකානු ඩොලර්වලින් කොපමණද;

(iii) එම ආයෝජන අතරින් මේ වනවිට ආරම්භ කර ඇති ව්‍යාපෘති කවරේද;

(iv) මේ වනවිට ආරම්භ කර නොමැති ව්‍යාපෘති ආරම්භ නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 107/2026

ගරු රවී කරුණානායක මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා,— මැතිවරණ සම්බන්ධයෙන් වන නීති සමාලෝචනය කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහාත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පසුගිය වසර කිහිපය මුළුල්ලෙහි ප්‍රයත්නයන් ගණනාවක්ම දරා ඇති හෙයින් ද;

මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා අවස්ථා ගණනාවක දී විශේෂ කාරක සභා පත්කර ඇති හෙයින් ද;

එකී කාරක සභා විසින් අන්තර්වාර වාර්තා කිහිපයක් ඉදිරිපත් කර ඇති හෙයින් ද; සහ

එකී කාරක සභා විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති හෙයින්;

පහත කරුණු ද ඇතුළත් වන පරිදි මැතිවරණ සම්බන්ධයෙන් වන නීති සමාලෝචනය කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහාත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි:—

(අ) මැතිවරණ සම්බන්ධයෙන් වන නීති, විශේෂයෙන්ම ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත, පළාත් සභා ඡන්ද විමසීම් පනත, පාර්ලිමේන්තු මැතිවරණ පනත, ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත සහ එම පනත්වලට වසර ගණනාවක් තුළ සිදු කරන ලද සංශෝධන සහ එම පනත්වල විධිවිධානයන්ට අදාළ වන විශේෂ විධිවිධාන පනත් සමාලෝචනය කිරීම;

(ආ) මෙම පනත් ප්‍රතිශෝධනය කිරීමේ, සංශෝධනය කිරීමේ සහ ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවය ඇගයීම;

(ඇ) මැතිවරණ සම්බන්ධයෙන් වන වර්තමාන නීති සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ සහ සංශෝධන නිර්දේශ කිරීම.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතු ය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතු ය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද,

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට වසර එකක (01) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.